# ශ්‍රී ලංකාවේ නිදහස් දිනය දා (පෙබරවාරි 4)

**බැසිල් ප්‍රනාන්දු**

මෙම වසරේ පෙබරවාරි 04 වෙනි දින ශ්‍රී ලංකාව ස්වකීය නිදහස ලැබීමෙහි 75 වෙනි සංවත්සරය සැමරීමට නියමිත මෙම අවස්ථාවේ දී රට පුරා සිටින ජනතාවගේ පොදු ප්‍රතිචාරය වී ඇත්තේ අපේක්ෂා බිඳවැටීමක් සහ රටේ පාලනයෙහි අසාර්ථකත්වය පිළිබඳ බරපතල විවේචනයක් වේ.

ශ්‍රී ලංකාවේ වර්තමානයේ ඇතිවී තිබෙන ආර්ථික කඩා වැටීම, දේශපාලන අර්බුදය සහ විශේෂයෙන් ම, අත්අඩංගුවට ගැනීමේ සහ රඳවා තබා ගැනීමේ බලතල අවභාවිතා කිරීම සහ සාධාරණ නඩු විභාගයක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම මගින් සහ, පොදුවේ නීතියේ නිසි ක්‍රියාවලින් පිළිබඳ තැකීමක් නොකිරීම මගින් රැස්වීමේ, සමාගමයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මර්දනය කිරීම සඳහා පොලිස් සේවා පද්ධතිය සහ අපරාධ යුක්ති බද්ධතිය බරපතල ලෙස දුර්වල කිරීම සහ නීතිය අවභාවිතා කිරීම අඛණ්ඩව වර්ධනය වීම සමග ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ පද්ධතිය ට එල්ල වී ඇති බරපතල තර්ජනය හේතුවෙන් වඩාත් දුෂ්කර තත්ත්වයකට පත්වී ඇති ශ්‍රී ලංකාවේ වර්තමානයේ නිර්මාණය තිබෙන තත්ත්වය පිළිබඳව සැලකිලිමත් වන සියලු පාර්ශ්ව තුළ නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් සම්බන්ධ ඇතැම් දුෂ්කර,ගැටලු පිළිබඳව සිතා බැලීමේ අවශ්‍යතාවය අදාළ සියලු පාර්ශ්වයන්ට දැඩි ලෙස දැනෙන අවශ්‍යතාවයක් වී තිබේ.

ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපතිවරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, පොලිස්පති, ජාතික බුද්ධි අංශ ප්‍රධානියා සහ රාජ්‍ය බුද්ධි සේවා ප්‍රධානියා ඇතුළු හිටපු ඉහළ ම රාජ්‍ය නිලධාරීන් කිහිප දෙකන් ශ්‍රී ලංකාවේ ජනතාවගේ ආරක්ෂාව සහ සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා ඔවුන්ට පැවරී ඇති වගකීම ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව සහ එහි ප්‍රතිඵලයක් ලෙස ආරක්ෂාවෙහි ඉතාමත් ම බරපතල ම අඩුපාඩු නිර්මාණය කරමින් 2019 වර්ෂයේ පාස්ක ඉරු දින විශේෂයෙන් ම පූජනීය ස්ථාන ඉලක්ක කරගනිමින් එල්ල කරන ලද බෝම්බ ප්‍රහාර හේතුවෙන් පුද්ගලයින් 270 ට අධික සංඛ්‍යාවක් මරණයට පත්වී, එයටත් වඩා විශාල සංඛ්‍යාවක් තුවාල ලැබූ බව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් හත් දෙනකගෙන් යුත් විනිසුරු මඩුල්ලක් මෑතක දී ලබා දුන් තීන්දුවකින් මගින් තීරණය කරන ලදී. මෙම තත්ත්වය නිරීක්ෂණය කළ ශ්‍රේෂ්ඨාධිකරණය මෙසේ සඳහන් කළේය, "ආරක්ෂාව, නීතිය හා සාමය සහ බුද්ධි අංශවලට අදාළ කටයුතු ඉටුකිරීමේ දී අපි දැක තිබෙන දැඩි අධීක්ෂණ අවශ්‍යතාවය සහ අකර්මණ්‍යතාවය පිළිබඳව අපි අපගේ කම්පනය සහ කලකිරීම ප්‍රකාශ කළ යුතු ය. රටේ ඉදිරි ගමන් මග සම්බන්ධයෙන් ඉතාමත් වැදගත් විමසා බැලීමක් අවශ්‍ය කරන, උපායමාර්ගික සම්බන්ධීකරණය, විශේෂඥභාවය සහ පෙර සූදානමක් නොමැතිකම පිළිබඳ පැහැදිලි උදාහරණ තිබේ. පාස්කු ඉරු දින ප්‍රහාර සහ ඒ හේතුවෙන් සිදුවූ මරණ හා විනාශයට තුඩු දුන් අසාර්ථකත්වයන් රටේ ආරක්ෂක යාන්ත්‍රණයෙහි මැකිය නොහැකි කැළලක් ඉතිරි කර තිබෙන අතර, බහු සංස්කෘතික හා බහු ආගමික පාලන සංවිධානයක ආශීර්වාදය ලත් මෙරට මෙවැනි අනුවණ විගඩම්වලට ඉඩදී, ප්‍රචණ්ඩත්වය, බිය, සැකය සහ අවිනිශ්චිතභාවය ඇති කරමින් පීඩා විඳීමට ඉඩ හැරිය නොහැක. මෙවැනි සිදුවීම් අමතක වී යා යුතු නමුත්, ඒවා ව්‍යවස්ථාදායක, ව්‍යුහාත්මක සහ පරිපාලනමය වෙනස්කම් සිදු කිරීමේ අවශ්‍යතාවය අපට පැහැදිලිව සිහිපත් කර දෙයි". (SC FR 20163/2019).

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අපේක්ෂා කරනු ලබන මෙම ව්‍යවස්ථාදායක, පරිපාලනමය සහ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමේ අරමුණ ඉටුකර ගැනීම නම්, ශ්‍රී ලංකාව විදේශ ණය ගෙවීම පැහැර හැර ඇති නිසා ශ්‍රේණිගත කිරීම් වල පහතට දමා ඇති තත්ත්වයක් තුළ, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළවල ශ්‍රී ලංකාව කෙරෙහි ඇති විශ්වාසය බරපතල ලෙස නැතිවී යාම වළක්වා ගැනීමේ මාර්ග සොයා ගැනීමට සිදුවනු ඇත. මේ අනුව, පාලනයෙහි තිබෙන අර්බුදය සහ ආර්ථික අර්බුදය මේ එකට බැඳී ඇත.

මේ තත්ත්වයට අදාළ බහුවිධ ප්‍රශ්න විසඳීම සඳහා රජය හෝ අනෙකුත් දේශපාලන පාර්ශ්වකරුවන් විසින් හෝ කිසිදු ප්‍රතිපත්තියක් හෝ සැලැස්මක් ඉදිරිපත් කර නොමැති බව රටේ පවතින පොදු විවේචනයයි. ඉදිරි මාසවලදී මෙම තත්ත්වයන් යහපත් අතර හැරෙනවා වෙනුවට තව තවත් නරක අතට හැරෙනු ඇතියි යන්න පොදු විශ්වාසය වේ.

වර්තමානයේ පවතින තත්ත්වය ව්‍යාකූල වුවත්, රට මේ තත්ත්වයට ඇද වැටීමට දීර්ඝ ඉතිහාසයක් ඇත. 1948 වර්ෂයේ දී රට බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වුවද, මෙම නිදහස හරවත් හා සැබෑ නිදහසක් නොව නාමික නිදහසක් විය. රට යටත් විජිත තත්ත්වයෙන් ස්වාධීන තත්ත්වයට පරිවර්තනය විය. නිර්මාණය කරන ලද පරිපාලන හා දේශපාලන ව්‍යුහයන් තාර්කික පාලන රාමුවක් තුළ ජනතාවගේ ආරක්ෂාව සහ සුබසාධනය සහතික කිරීමට ප්‍රමාණවත් වන තරමට වර්ධනය වී නැත. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාව කිසිදු අවස්ථාවක නවීන රාජ්‍යයක තත්ත්වයට වැඩි දියුණු වී නැත. 1815 වර්ෂයේ දී බ්‍රිතාන්‍යයින් රටේ පාලනය

අත්පත් කර ගැනීමට පෙර ක්‍රි.ව. 9 වැනි සියවසෙහි පමණ සිට ක්‍රි.ව. 19 වැනි සියවසේ මුල් භාගය දක්වා පැවති පාලන ව්‍යුහය දැඩි ලෙස කුලය පදනම් කරගෙන මිනිසුන් වෙන් කිරීම මත පදනම් වූ ව්‍යුහයක් විය. සිංහල භාෂාව කතා කරන බහුතර ප්‍රජාව තුළ කුලීන (බලය සහ ධනය ඇති අය) සහ කුලහීන (බලය සහ කිසිදු ගරුත්වයක් නොමැති අය) අතර සම්බන්ධතාවය ලෙස එම බෙදීම සිදු විය. දෙමළ ප්‍රජාව තුළ ද එවැනි විවිධ නම් යටතේ ඒ සමාන සමාන කුල ක්‍රමයක් ක්‍රියාත්මක විය. මේ අනුව, මෙම සියවස් කිහිපයක දීර්ඝ කාලය තුළ, සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා සහිත පුද්ගලයින් පිළිබඳ අදහසක් නොතිබුණි.

මෙම කුල ක්‍රමය රඳා පැවති ප්‍රතිපත්ති දෙක මෙසේ විය: මිනිසුන් ඔවුන් අයත් වන කුල කණ්ඩායම් තුළ ම සිරකරුවන් ලෙස තබා, ඉහළ සමාජ තලයන්ට යාම සම්පූර්ණයෙන් තහනම් කර තිබූ අතර, ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට දරන ලද ඕනෑම උත්සාහයක් අතිශය බරපතල දඬුවම් සහිත දණ්ඩනයන්ට යටත් විය; සහ අසමාන හා සමානුපාතික නොවන දඬුවම් පැනවීම ඒ සම්බන්ධ දෙවන දෙවන මූලධර්මය විය. පහත් කුලයට අයත් යැයි සලකනු ලබන පුද්ගලයෙක් සුළු වරදක් කළ හොත්, එම පුද්ගලයා සහ ඔහුගේ හෝ ඇයගේ පවුල පවා මරණයට පත් කර, ඔවුන්ට අයත් දේපළ ද විනාශයට පත් කළ හැකි බව එයින් අදහස් විය. එසේ වුවත්, අඩු වරප්‍රසාද ලත් කණ්ඩායම්වලට එරෙහිව සිදු කරන බරපතළ අපරාධ සම්බන්ධයෙන් පවා උසස් කුලයට අයත් යැයි සලකන ලද අයට දඬුවම් කළ නොහැකි විය.

එම දීර්ඝ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලාංකීය සමාජය සංවිධානය වී තිබූ කුළුණු වූයේ එකී මූලධර්ම දෙකයි. දිගු කාලයක් පුරා පවත්වා ගෙන ආ මෙම භාවිතයන් මනසේ ස්වභාවයන් හා සමාජ චර්යාවක් ලෙස සථාපනය වී තිබූ අතර, එය මේ දක්වාම පැවත එමින් වර්තමානයේ පවා දැකිය හැකි 'සංස්කෘතියක්' නිර්මාණය කළේය. බ්‍රිතාන්‍යයින් ඔවුන්ගේ පාලන කාලයේදී හඳුන්වා දුන් යම් තාර්කික පරිපාලන ක්‍රමවේද නිසා මතුපිටින් මේ තත්ත්වයෙහි යම් යම් වෙනස්කම් සිදු වූ නමුත්, මෙරට තුළ මුල් බැසගෙන තිබූ එම මර්දනකාරී සංස්කෘතියෙහි හරය ස්පර්ශ කිරීමට එම ක්‍රමවේද වලට නොහැකි විය. පසුගිය දශක කිහිපය තුළදී පවා, බ්‍රිතාන්‍යයින් විසින් හඳුන්වා දෙන ලද මෙම සීමිත නවකරණයන් දැඩි බාදනයකට ලක්වී ඇත. ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් විතැන් කිරීමට උත්සාහ දරන, වඩාත් මර්දනකාරී සමාජයකට නැවත පැමිණීම වර්තමාන කාලය තුළ බොහෝ සෙයින් විද්‍යමාන වේ.

ජාතිය සතු සියලු බලය ජනතා පරමාධිපත්‍යය තුළින් ගොඩනැගෙන්නේය යන මූලධර්මය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් ම පිළිගෙන තිබුණ ද, ශ්‍රී ලංකාව විසින් ජනතා පරමාධිපත්‍යය යන පදනම මත ස්වකීය රාජ්‍ය යාන්ත්‍රණය සකස් කිරීම අවහිර කිරීමට මෙම සියලු කරුණු දායක වී තිබේ. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, එනම් 1978 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ම ජනතා පරමාධිපත්‍යය වෙනුවට ප්‍රධාන විධායකයේ පරම බලය තහවුරු කර ඇත. ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් යන මූලධර්ම මත පදනම් වූ රාජ්‍ය යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට මෙම ව්‍යවස්ථාව ප්‍රධාන ම බාධකයක් වී තිබේ. මෙම ව්‍යවස්ථාව වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදයේ සම්මතයන් සහ ප්‍රමිතීන් යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම තුළින් ජනතා පරමාධිපත්‍යය තහවුරු කරන ව්‍යවස්ථාවක් ස්ථාපනය කිරීම ශ්‍රී ලංකා රාජ්‍යය සහ ජනතාව මුහුණ දී සිටින ප්‍රධාන ම කාර්යයක් වේ. නුදුරු අනාගතයේ දී ම මෙම ගැටලුව සාධනීය ලෙස විසඳන ආකාරය අනුව ජනතාවගේ ආරක්ෂාව බොහෝ දුරට රඳා පවතිනු ඇත.

ජාතියක් ගොඩනැගිය හැකි වන්නේ එවැනි ජාතියක ජීවත්වන සියලු දෙනාගේ ම සමානාත්මතාවය පදනමින් ජනතාව අතර පවතින සහයෝගීතාවය මත පමණි. නීතිය මගින් විධිමත් ලෙස පිළිගෙන තිබුණ ද, සමානාත්මතාවය පිළිබඳ සංකල්පය සමාජයේ සෑම අංශයකම සමගිය ඇති කළ හැකි ආකාරයකට ක්‍රියාත්මක කර නැත. තමන්ගේ ම සමාජය තුළ තමන්ව සම්පූර්ණයෙන්ම හුදෙකලා කර ඇති බව දිළිඳු ජනයාට හැඟී යයි. මහජන නියෝජිතයන් සහ ජනතාව අතර පවතින මහත් පරතරය හේතුවෙන් පාර්ලිමේන්තුව කෙරෙහි ජනතාව තුළ ඇති විශ්වාසය නැති වී ගොස් තිබෙන බව ප්‍රමුඛ පෙළේ දේශපාලනඥයෝ පවා පිළිගනිති. කෙසේ වෙතත්, එය පිළිගනු ලැබුව ද, මෙම ගැටළුව විසඳා රාජ්‍යය කෙරෙහි ඇති විශ්වාසය නැවත ගොඩ නැගීමට දරන සැබෑ ප්‍රයත්නයක් නැත.

සෑම තැනකදී ම, ජීවිතයේ සෑම අංශයකට ම අදාළව, සෑම ප්‍රජාවකගේ ම සමාජයේ දුර්වල කොටස්වලට වෙනස්කොට සැලකීම වැනි බොහෝ සාධක මත පදනම්ව තීරණ ගැනීම එහි ප්‍රතිඵලය වේ: එහෙත් එක් ජාතියක් බවට ඒකරාශීවීම වළක්වන, කුලය පදනම් කර ගත් සංස්කෘතික පිළිවෙත් නිසා බෙදීම නැමති මානසිකත්වය අඛණ්ඩව පවතියි. සුළුතර කණ්ඩායම් වලට එරෙහි වෙනස් කොට සැලකීම මගින් ද එම ප්‍රතිඵලය ම ගෙන දෙන අතර, එය නිරන්තර වැරදි අවබෝධයන්ට සහ ගැටුම්වලට මුලපුරන්නක් වේ: කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම ද රට තුළ බෙදීම් ඇතිකරන එක් ආකාරයකි. පුරවැසියන් අතර සමානාත්මතාවය සහතික කිරීම අපොහොසත් කරවන මෙකී සහ වෙනත් ආකාරවල අසාර්ථකත්වයන් රට මුහුණ දෙන සියලු ප්‍රධාන ගැටළු සම්බන්ධයෙන් එකඟත්වයකට එළඹීම වළක්වයි.

අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය ඉතා පැහැදිලිව දක්නට ලැබෙන පරිදි දුර්වල වීම මේ මොහොතේ වඩාත් ම තැතිගන්වසුළු සාධක වලින් එකක් වී තිබේ. මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, සොරකම් සහ මංකොල්ලකෑම් වැනි අපරාධ පුළුල් ලෙස පැතිරී ඇති අතර, ඒ සියල්ලට ම වඩා දූෂණය හිමාලය කඳු මුදුන තරම් ඉහළ

මට්ටමකට වැඩිවී තිබේ. පොලිස්පතිවරයා ම පවා මෙම ගැටලුවෙහි ඇති බරපතළකම පිළිගන්නා තරමට පොලිසියේ අපරාධ විමර්ශන හැකියාව සහ ගුණාත්මකභාවය පිරිහී ඇත. එසේම, නීතිපති දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අභිචෝදක කාර්යාලය ද නිරන්තර විවේචනයට ලක්වී ඇත. මුළු අධිකරණ පද්ධතිය ම අතිශය නිදන්ගත ප්‍රමාදයකින් පෙළෙන අතර, එය නඩුකියන්නන්ට මෙන්ම නඩු වල සාක්ෂිකරුවන්ට ද ගැටලු ඇති කරයි. විවිධ වූ හේතූන් මත යුක්තිය ඉටුකර ගැනීමට නොහැකි වූ බවට මැසිවිලි නගන අය ම අධිකරණ පද්ධතිය කෙරෙහි ඔවුන් තුළ තිබූ විශ්වාසය නැති වී ගොස් ඇති බව ද පවසති. මේ සියල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස, පාලනයක් නොමැතිවීම සහ වැරදි පාලනය තුළින් ඇති වන අනාරක්ෂිතභාවය පිළිබඳ පොදු හැඟීමක් ඇත. ප්‍රධාන වශයෙන් ම ශ්‍රී ලංකාව තුළ පවතින උග්‍ර විරැකියාව හේතුවෙන් තරුණ පරම්පරාව මහා පරිමාණයෙන් විදෙස් රටවලට සංක්‍රමණය මෙන් සිටිති.

මෙවැනි වාතාවරණයක් තුළ, සෑම තැනක ම පුළුල්ව පැතිරුණු අතෘප්තිය සහ විරෝධතා ඇතිවීම ස්වභාවික ය. නමුත්, අවාසනාවට, ජනතාවගේ ගැටලු පිළිබඳව විවෘතව සාකච්ඡා කිරීමට උත්සාහ කරනවා වෙනුවට රජය ඔවුන්ට එරෙහි මර්දනය ක්‍රියාත්මක කිරීමට යොමු වෙයි. විශේෂයෙන් ම, මෙම ගැටළු කෙරෙහි අවධානය යොමු කරවීම සඳහා සාමකාමී ප්‍රයත්නයන් දැරීමේ කැපී පෙනෙන හැකියාවක් පෙන්නුම් කර ඇති තරුණ පරම්පරාවට නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්, නීති විරෝධී රඳවා තබා ගැනීම් සහ සාමකාමී පෙළපාලිකරුවන්ට දරුණු ප්‍රහාර එල්ල කිරීම ආදී ක්‍රම යොදා ගනිමින් කුරිරු ලෙස සලකනු ලැබේ.

පොලිසිය විසින් ත්‍රස්තවාදය වැලැක්වීමේ නීති කිසිදු සාධාරණ පදනමකින් තොරව අවභාවිත කර ඇති බව පසුගිය දිනක නඩුවක් විභාග කළ මහේස්ත්‍රාත්වරයා ද නිරීක්ෂණය කළේය. එසේම, මාධ්‍ය, විශේෂයෙන් ම සමාජ මාධ්‍ය ජාලවල නිරත වන්නන්, දැඩි ප්‍රහාරයන්ට ලක්ව ඇත.

මෙම වාතාවරණය තුළ, ශ්‍රී ලංකාව මෙකී ගැටලු විසඳීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය යන්න නිදහස් දිනය සියලු දෙනාට සිහිපත් කර දෙයි. මෙය කළ හැකි එකම ක්‍රමය වන්නේ රටේ සංවර්ධනයෙහි ප්‍රගතිය අවහිර කරමින් තිබෙන ආර්ථික, දේශපාලන, සමාජීය සහ සංස්කෘතික ගැටලුවලට විසඳුම් සපයා දීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපත්ති සහ සැලසුම් පිළිබඳව රටපුරා පුළුල් කතිකාවක් නිර්මාණය කිරීම සඳහා සහභාගි වීමට ජනතාවට ඉඩ ලබා දීම යි. සමානාත්මතාවය, ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් යන පදනම මත නිදහස සැබෑ කර ගැනීමට සහ සමස්ත ජාතියේ ම සහයෝගීතාවය ශක්තිමත් කිරීමට ජනතාවට සහ රාජ්‍යයට සහාය විය හැක්කේ විචාරාත්මකව සිතන ජනයාට පමණි. රටේ ඉතිහාසයේ මෙම අතිශය තීරණාත්මක අවස්ථාවේ දී එවැනි විචාරාත්මක ජනයාට සාමකාමීව සහ නිර්මාණාත්මකව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කර දීම රජයේ වගකීම වේ.

# # #

***The Asian Human Rights Commission (AHRC)*** *works towards the radical rethinking and fundamental redesigning of justice institutions in order to protect and promote human rights in Asia. Established in 1984, the Hong Kong based organisation is a Laureate of the Right Livelihood Award, 2014.*